# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1711/5 – 2011 ජුනි 20 වැනි සඳුදා – 2011.06.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 3/2/3/10/244.

වේයන්ගොඩ කටුවස්ගොඩ මාර්ගයේ වෙල මැද පාර සඳහා කුඹුරු ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 321 ඒ කටුවස්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුවස්ගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම් 3767 දරන සැලැස්මේ සඳහන් ඉඩම් කොටස්.

**කැබලි අංක 01**
ඉඩමේ නම: දඹුගහකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: ආර්. පී. නිමල් ප්‍රේමසිරි, නො. 05, ශ්‍රියාවාස, කටුවස්ගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0054.

**කැබලි අංක 02**
ඉඩමේ නම: දඹුගහකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: ආර්. පී. සිසිර සේනාරත්න, නො. 90/1, කටුවස්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0057.

**කැබලි අංක 03**
ඉඩමේ නම: දඹුගහකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: ආර්. පී. නිමල් ප්‍රේමසිරි, නො. 05, ශ්‍රියාවාස, කටුවස්ගොඩ, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0048.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 19 වැනි දින පෙ.ව. 10.00ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 සැප්තැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සුනිල් ජයලත්,
ප්‍රාදේශීය ලේකම් (වැ.බ.),
අත්තනගල්ල.

2011 ජුනි මස 16 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

07 - 149


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.